මාධ්‍ය වාර්තාකරණයන් ඔස්සේ සමාජගත වන අදහස් තුලින්, විවිධ කණ්ඩායම් කෙරෙහි අගතීන් ඇතිවන ආකාරයකින් කටයුතු නොකිරීමට මාධ්‍ය ප්‍රවේසම් වියයුතු බව විශේෂයෙන් කිවයුතු නොවේ.
එම පසුතලය යටතේ, ඉරිදා දිවයින පුවත්පතේ (පෙබ. 26, 2023) "සෙල්ලම් නැත වැඩ නයිස් මෙන්න 'ටොම් බෝයිස්' කොල්ලන්ට අදින කෙල්ලන්ගේ කතාව" යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් වී තිබූ විශේෂාංග ලිපිය විමසා බැලිය හැක.
මෙම ලිපිය තුළ,
1) "උත්පත්තියෙන් තමුන් ලද පිරිමිකම හෝ ගැහැනුකම යටපත් කර විරුද්ධ ලිංගිකයෙකු මෙන් හැසිරෙන, රඟපාන අය අද අපට සමාජය තුළ නිතර මුණ ගැසේ."
2) "'සමලිංගික සේවනය' යනු බොහෝ දෙනා පිළිකුලෙන් ඉවතලන අපුල දෙයක් බව අප කිව යුතුය."
3) "අසාමාන්‍ය මනෝවිද්‍යාවේ උගන්වන අසම්මත චර්යාවක් වන පැරපිලියාව නම් තත්වයට මෙකී ස්ත්‍රීන් හෝ තරුණියන් ඇතුල් වෙයි."
4) "ලෙස්බියන් ලෙසින් පසුවට වර්ධනය වන මෙම ක්‍රියාවලියේ මුල්ම අවධිය සමහර විට ටොම් බෝයි හෙවත් දඟකාර කොලු කෙල්ල' තත්වයෙන් පැවතිය හැක... සෑම ටොම් බෝයි කෙනෙක්ම අනාගතයේ සමලිංගික සේවනයට යොමු වන අසම්මත චර්යා රටාවක් සහිත පිරිමි ගැනියෙකු වන බවට කාටවත් නිගමනය කළ නොහැක."
5) "ඔබ දන්නා ගැහැනු දරුවෙකු කුඩාකල සිටම මෙසේ පිරිමි ඇඳුම් ඇඳ කොල්ලෙකු මෙන් හැසිරෙන්නට තැත් කරන්නේ නම් පොරව අතට ගන්න නොතියා නියපොත්තෙන්ම එය කඩා දමන්නට උත්සාහ කරන්නේ නම් එය මහඟු පිනකි."
වැනි අදහස් දැක්වේ.
ඔබ සිතන ලෙසට,
1) පුද්ගලයින්ගේ ලිංගික අනන්‍යතාවයන් (Gender Identity) සහ ලිංගික නැඹුරුතාවයන් (Sexual Orientation) සම්බන්ධයෙන්, මෙවැනි ඒකාකෘතික කිරීම් සමාජගත කිරීම සුදුසු ද?
2) එය විවිධ ලිංගික අනන්‍යතාවයන් හෝ ලිංගික නැඹුරුතාවයන් සහිත කොටස් සමාජය තුළ කොන් කිරීමකට ලක් නොකරන්නේ ද?
3) ඒ අනුව, මෙම විශේෂාංග ලිපිය පසුගාමී අදහස් සමාජගත කරන්නේ යැයි ඔබ නොසිතන්නේ ද?
https://www.nuj.org.uk/.../B121E12D-034D-4A3D.../
https://www.meaa.org/.../code-of-ethics/lgbtqia-guidelines/
https://www.glaad.org/reference#guide
https://www.apa.org/pi/lgbt/resources/language#1
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# "ටොම් බෝයිස්"?

ETHICS EYE

අසාමාන්‍ය මනෝ විද්‍යාවේ (Abnormal Psychology) උගන්වන අසම්මත චර්යාවක් (Sexual Disorders) වන පැරපිලියාව (Pharaphilias) නම් තත්ත්වයට මෙකී ස්ත්‍රීන් හෝ තරුණියන් ඇතුල් වෙයි.

## සෙල්ලම් නැත වැඩ නයිස් මෙන්න "ටොම් බෝයිස්" කොල්ලන්ට අඳින කෙල්ලන්ගේ කතාව




ඔබ දන්නා ගැහැනු දරුවෙක් කුඩාකල සිටම මෙසේ පිරිමි ඇඳුම් ඇඳ කොල්ලෙකු මෙන් හැසිරෙන්නට තැත් කරන්නේ නම් පොරව අතට ගන්න නොතියා නියපොත්තෙන්ම එය කඩා දමන්නට උත්සාහ කරන්නේ නම් එය මහඟු පිනකි.

ලෙස්බියන්ස් (Lesbian) ලෙසින් පසුවට වර්ධනය වන මෙම ක්‍රියාවලියේ මුල්ම අවධිය සමහර විට ටොම් බෝයි (Tom boy) හෙවත් ''දඟකාර කොලු කෙල්ල'' තත්ත්වයෙන් පැවැතිය හැක.